සියලුම හිමිකම් ඇවිරිණි.
All Rights Reserved



# අධ්‍යයන පොදු සහතික පත්‍ර (උ/පෙළ) විභාගය

# යුරෝපා ඉතිහාසය - I

**13 ශ්‍රේණිය** | **කාලය පැය 01 යි.**

- මෙම කොටසේ ප්‍රශ්න 40 ක් ඇත. සියලුම ප්‍රශ්න වලට පිළිතුරු සපයන්න.
- එක් එක් ප්‍රශ්නයට ප්‍රතිචාර පහක් දී ඇති නමුදු නිවැරදි පිළිතුර වන්නේ එකක් පමණි.
- ප්‍රශ්නයට නිවැරදි පිළිතුර වශයෙන් ඔබ එක් ප්‍රතිචාරයක් තෝරා ගත් පසු එය දක්වා ඇති උපදෙස් පරිදි ලකුණු කරන්න.
- මෙම කොටසට ලකුණු 40 ක් දෙනු ලැබේ.
- I කොටසට පිළිතුරු ලියා අවසන් වූ පසු එම කොටස II කොටසේ පිළිතුරු පත්‍ර සමඟ අමුණා භාර දෙන්න.

---

- අංක 01 සිට 10 තෙක් වූ ප්‍රශ්න වලට එක් එක් ප්‍රශ්නය සඳහා නම් පහ බැගින් දක්වා ඇත. ඒවා අතරින් එකක් පමණක් කවර හෝ හේතුවක් නිසා අනෙක් නම් සමග නොගැලපේ. එම නොගැළපෙන නම කුමක්දැයි හඳුනාගෙන එහි අංකය තිත් ඉර මත ලියන්න.

01. (1) රිචලියු (2) මැසරින් (3) නෙකර්
(4) කෝල්බෙයාර් (5) ඩැන්ටන් (......)

02. (1) ජෝන් වෙක්ලින් (2) මාටින් ලූතර් (3) ජෝන් කැල්වින්
(4) උල්රිච් ස්වින්ග්ලි (5) හෙන්රි හඩ්සන් (......)

03. (1) ෂොල්ෆරිනෝ (2) වෝටර්ලූ (3) ලිප්ෂිග්
(4) ඔස්ටලිට්ස් (5) ට්‍රැෆල්ගාර් (......)

04. (1) කෝටේස් (2) ස්ටේට්ස් ජනරාල් (3) සෝවියට්ස්
(4) පාර්ලිමේන්තුව (5) ඩූමා (......)

05. (1) විස්ටියුලා (2) කීල් (3) රයින්
(4) ෂේන් (5) එල්බි (......)

06. (1) ලියනාඩෝ ඩාවින්චි (2) නිකලෝ මකියාවෙලි (3) බොට්ෂෙලි
(4) ප්‍රැන්සිස් පෙට්රාක් (5) මැසාක්සිඩ් (......)

07. (1) නිකලස් කොපර්නිකස් (2) ජොහැන්ස් කෙප්ලර් (3) ජෝන් වෙක්ලිෆ්
(4) ගැලිලියෝ ගැලීලි (5) පැරසෙල්සස් (......)

08. (1) බර්තලමියු දියෙස් (2) අල්බකර්ක් (3) ප්‍රැන්සිස්කෝ පිසාරෝ
(4) ඇමරිගෝ වෙස්පුචි (5) මැගලන් (......)

09. (1) ජේම්ස් හැග්‍රීව්ස් (2) රිචඩ් ආක්රයිට් (3) ජේම්ස් වොට්
(4) ඔලිවර් කොම්වෙල් (5) තෝමස් නිව්කොමන් (......)

10. (1) රොබට් වෝල්පෝල් (2) රොබට් පිල් (3) රොබට් ඕවන්
(4) බෙන්ජමින් ඩිෂ්රයිල් (5) වින්ස්ටන් චර්චිල් (......)

- **පහත දක්වා ඇති මාතෘකාවට අදාළව ඇති කරුණු අතරින් එක් කරුණක් මාතෘකාවට අදාළ නොවේ. එම කරුණ තෝරා එහි අංකය වරහන් තුළ ලියන්න.**

11. ප්‍රංශ විප්ලවය
    (1) ස්ටේටස් ජනරල් සභාව කැඳවීම (2) බැස්ටීලය බිඳවැටීම
    (3) 16 වැනි ලුවීගේ හිසගසා දැමීම (4) දහඅට වන ලුවී රජ වීම
    (5) භීම සමය (......)

12. නැපෝලියන් බොනපාට් විසින් අත්සන් කළ ගිවිසුම
    (1) කැම්පොපෝමියෝ ගිවිසුම (2) ලුනෙවිල් ගිවිසුම
    (3) වියානා ගිවිසුම (4) ඒමියන්ස් ගිවිසුම
    (5) විල්ෂිට් ගිවිසුම (......)

13. දෙවැනි ලෝක යුද්ධයේ ප්‍රතිඵල
    (1) ජර්මනිය විනාශ වීම
    (2) මුළු ලෝකය නිරායුධකරණය කිරීම
    (3) ලෝකය ප්‍රතිවිරුද්ධ කඳවුරු දෙකකට බෙදීම
    (4) එක්සත් ජාතීන්ගේ සංවිධානය බිහිවීම
    (5) අධිරාජ්‍යයන් පරිහානියට පත්වීම (......)

14. එංගලන්තයේ පාර්ලිමේන්තුවේ වර්ධනය
    (1) 1215 මහා අධිකාරි පත්‍රය අත්සන් කිරීම
    (2) 1628 දී I චාල්ස් අයිතිවාසිකම් පිළිබඳ පෙත්සම පිළිගැනීම
    (3) 1689 අයිතිවාසිකම් පිළිබඳ ප්‍රකාශය
    (4) 1776 අමරිකාවේ යටත් විජිත නිදහස ප්‍රකාශ කිරීම
    (5) 1867 ප්‍රතිසංස්කරණ පණත සම්මත කිරීම (......)

15. නිරවි යුද්ධ සමය
    (1) උතුරු අත්ලාන්තික් ගිවිසුම් සංවිධානය
    (2) වෝර්සෝ ගිවිසුම් සංවිධානය
    (3) ඇමෙරිකා එක්සත් ජනපදය හා සෝවියට් දේශය අතර න්‍යෂ්ටික අවි තරගය
    (4) නොබැඳි ජාතීන්ගේ සංවිධානය
    (5) ජාතීන්ගේ සංගමය (......)

- **නොගැලපෙන කරුණ ඇතුළත් වරණයේ අංකය වරහන් තුළ ලියන්න.**

16. (1) පිරනීෂ් කඳුවැටිය (2) ඩැනියුබ් ගඟ (3) කොන්ස්තන්තිනෝපලය
    (4) බෝලාන් දුර්ගය (5) පෝලන්ත කපොල්ල (......)

17. (1) ජෝන් ලොක් (2) දින් ජැක්වින් රූසෝ (3) ශාන්ත තෝමස්
    (4) මොන්ටෙස්කියු (5) වෝල්ටෙයාර් (......)

18. (1) අයිලා චැපෙල් (2) ට්‍රෙන්ට් (3) ලයිබැක්
    (4) ට්‍රොපව් (5) වෙරෝනා (......)

The National e-learning Portal for The General Education

19. (1) හිට්ලර් (2) මුසෝලිනි (3) එස්තෝනියා
(4) නෙවිල් චෙම්බර්ලේන් (5) ස්ටාලින් (......)

20. (1) නීතියේ සාරය (2) ලෙවියතන් (3) සමාජ සම්මුතිය
(4) දාස් කැපිටාල් (5) මෙන්ෂෙවික් (......)

- **21 - 25 දක්වා වූ ප්‍රශ්න වලට පිළිතුරු සැපයීමට පෙර පහත දී ඇති උපදෙස් සම්පිණ්ඩනය කියවා අදාල අංකය වරහන් තුළ ලියන්න.**

**උපදෙස් සම්පිණ්ඩනය**

| | |
|---|---|
| A සහ B පමණක් නිවැරදි නම් | 1 |
| B සහ C පමණක් නිවැරදි නම් | 2 |
| C සහ D පමණක් නිවැරදි නම් | 3 |
| D සහ E පමණක් නිවැරදි නම් | 4 |
| ප්‍රතිචාර එකක් හෝ දෙකකට වැඩි සංඛ්‍යාවක් නිවැරදි නම් | 5 ද වරහන් තුළ ලියන්න. |

21. කාර්මික විප්ලවයේ ප්‍රතිඵල
A කෘෂිකර්මය දියුණු වීම
B පරිසරය ආරක්ෂා වීම
C නාගරීකරණය
D මහා පරිමාණ නිෂ්පාදන
E ඉඩම් හිමි ප්‍රභූ පන්තියේ වර්ධනය (......)

22. ආගමික ප්‍රතිසංස්කරණ ව්‍යාපාරයට තුඩුදුන් හේතු සාධක
A පාප් වහන්සේ සහ පූජකවරු අතර මතභේද
B මාටින් ලූතර්ගේ නායකත්වය
C කතෝලික සභාවේ පැවති දූෂණ
D පූර්ණ ළල පත්‍රිකා විකිණීම
E එංගලන්තයේ බිසවගේ විවාහය (......)

23. ප්‍රංශ විප්ලවයට සම්බන්ධ පුද්ගලයන් වන්නේ,
A III ජෝර්ජ්
B මිරාබෝ
C නැපෝලියන් බොනපාට්
D II චාල්ස්
E VIII වන හෙන්රි (......)

24. I වැනි ලෝක සංග්‍රාමයේ ප්‍රතිඵල වන්නේ,
A වියානා මතය
B බෝල්ෂෙවික් විප්ලවය
C අධිරාජ්‍යවාදයේ වර්ධනය
D වර්සෙල්ස් ගිවිසුම
E ජාතීන්ගේ සංගමය බිහිවීම (......)

25. නව රාජාණ්ඩු ක්‍රමයේ ප්‍රධාන ලක්ෂණ වන්නේ,
A බලතල සංකේන්ද්‍රගත කිරීම
B පල්ලියේ බලය වර්ධනය වීම
C රදල පන්තියේ බලය දුර්වල වීම
D ස්ථාවර යුද්ධ හමුදාව
E ප්‍රවේණි ක්‍රමය වර්ධනය වීම (......)

The National e-learning Portal for The General Education

- **X හා Y තීරුවල සංයෝග ගලපා නිවැරදි සංයෝගයට අදාළ අංකය වරහන් තුළ ලියන්න.**

26.

| | X | | Y |
|---|---|---|---|
| (i) | වැඩවසම් ක්‍රමය | A | ධර්මාධිකරණය |
| (ii) | ශාස්ත්‍රීය පුනරුදය | B | බලය සංකේන්ද්‍රගත වීම |
| (iii) | නව රාජාණ්ඩුව | C | ස්වාභාවිකත්වයට නැඹුරු වීම |
| (iv) | ප්‍රතිරෙපරමාදු | D | ප්‍රවේණි ක්‍රමය |
| (v) | කාර්මික විප්ලවය | E | අධිරාජ්‍යවාදය |

(1) DCBAE (2) DCABE (3) DEBAC (4) DABCE (5) DBACE (......)

27.

| | X | | Y |
|---|---|---|---|
| (i) | වොල්ගා ගඟ | A | කළු මුහුද |
| (ii) | ඩැනියුබ් ගඟ | B | බෝල්ටික් මුහුද |
| (iii) | තේම්ස් ගඟ | C | උතුරු මුහුද |
| (iv) | එල්බ් ගඟ | D | ඉංග්‍රීසි ඕඩය |
| (v) | ඕඩර් ගඟ | E | කැස්පියන් මුහුද |

(1) CBDEA (2) CABED (3) CDEAB (4) CEABD (5) CBDAE (......)

28.

| | X | | Y |
|---|---|---|---|
| (i) | IV වැනි හෙන්රි | A | රුසියාව |
| (ii) | ෆෙඩ්රික් විලියම් | B | ප්‍රශියාව |
| (iii) | I වැනි ජේම්ස් | C | පීඩ්මොන්ට් |
| (iv) | II වැනි නිකලස් | D | එංගලන්තය |
| (v) | චාල්ස් ඇල්බට් | E | ප්‍රංශය |

(1) EACDB (2) EDACB (3) EBDAC (4) ECBDA (5) EDCAB (......)

29.

| | X | | Y |
|---|---|---|---|
| (i) | සැවෝයි | A | හොල්ස්ටයින් |
| (ii) | ඇල්සාස් | B | කීස් |
| (iii) | සාර්ස්නියා | C | බැග්ඩැඩ් |
| (iv) | ෂෙල්ස්විග් | D | පීඩ්මොන්ට් |
| (v) | බර්ලින් | E | ලොරේන් |

(1) BEDAC (2) BDACE (3) BCDAE (4) BDCEA (5) BAECD (......)

| | X | | Y |
|---|---|---|---|
| 30. (i) | ප්‍රංශය | A | වස්කෝ ද ගාමා |
| (ii) | ඕලන්දය | B | ක්‍රිස්ටෝපර් කොලම්බස් |
| (iii) | පෘතුගාලය | C | ජෝන් කැබෝ |
| (iv) | ස්පාඤ්ඤය | D | ජැක්විෂ් කාමියර් |
| (v) | එංගලන්තය | E | හෙන්රි හඩ්සන් |

(1) DACBE (2) DEACB (3) DAECB (4) DEABC (5) DBACE (......)

| | X | | Y |
|---|---|---|---|
| 31. (i) | මුෂලීනි | A | නව රතු හමුදාව |
| (ii) | මාසිනි | B | ලේ සහ යකඩ |
| (iii) | ගාරිබෝල්ඩි | C | රතු කමිස හමුදාව |
| (iv) | බිස්මාර්ක් | D | යෞවන ඉතාලිය |
| (v) | ලෙනින් | E | කලු කමිස හමුදාව |

(1) ECBAD (2) EBADC (3) EDCBA (4) EADBC (5) EDACB (......)

| | X | | Y |
|---|---|---|---|
| 32. (i) | දෙවනි පිලිප් | A | ඔස්ට්‍රියාව |
| (ii) | හතරවැනි හෙන්රි | B | ස්පාඤ්ඤය |
| (iii) | මරියා තෙරේසා | C | රුසියාව |
| (iv) | දෙවැනි නිකලස් | D | පීඩ්මොන්ට් සහ සාර්ඩිනියා |
| (v) | වික්ටර් ඉමානුවෙල් | E | ප්‍රංශය |

(1) BACED (2) BDACE (3) BEACD (4) BCDEA (5) BAECD (......)

| | | | |
|---|---|---|---|
| 33. (i) | බෙස්ට්ෆේලියා සාම ගිවිසුම | A | 1713 |
| (ii) | යුම්රෙච් සාම ගිවිසුම | B | 1829 |
| (iii) | ඇඩ්‍රියානෝපල් ගිවිසුම | C | 1919 |
| (iv) | විලාප්‍රැන්කා ගිවිසුම | D | 1648 |
| (v) | වර්ෂෙල්ස් ගිවිසුම | E | 1859 |

(1) DBECA (2) DABEC (3) DEACE (4) DCAEB (5) DBACE (......)

| | | | |
|---|---|---|---|
| 34. (i) | තිස් අවුරුදු යුද්ධය | A | II ඇලෙක්සැන්ඩර් |
| (ii) | සත් අවුරුදු යුද්ධය | B | නැපෝලියන් බොනපාට් |
| (iii) | වෝටර්ලු සටන | C | ගුස්ටාවුස් ඇඩොල්ප්ස් |
| (iv) | ක්‍රිමියන් යුද්ධය | D | XV වන ලුවී |
| (v) | සොල්ෆරිනෝ සටන | E | III නැපෝලියන් |

(1) CDBAE (2) CBAED (3) CAEBD (4) CDAEB (5) CADBE (......)

The National e-learning Portal for The General Education

35. (i) තෝමස් නිව්කොටන් — A ස්පිනිං ජේනි

(ii) ජේම්ස් හාග්‍රේව්ස් — B විදුලි බලය

(iii) විලියම් ගිල්වර්ට් — C වාෂ්ප එන්ජිම

(iv) මාර්කෝනි — D දුරකථනය

(v) ග්‍රැහැම් බෙල් — E ගුවන් විදුලිය

(1) CBDEA (2) CABED (3) CDEAB (4) CEADB (5)CBDAE (......)

- **36 - 40 දක්වා පහත වූ වගුව ඇසුරෙන් පිළිතුරු සපයන්න.**

| | පළමුවන වගන්තිය | දෙවන වගන්තිය |
|---|---|---|
| (1) | නිවැරදිය. | වැරදිය. |
| (2) | නිවැරදිය. | නිවැරදිය. |
| (3) | වැරදිය. | වැරදිය. |
| (4) | වැරදිය. | නිවැරදිය. |
| (5) | නිවැරදිය. | නිවැරදි අතර පළමු ප්‍රකාශය විස්තර කරයි. |

| | පළමුවන වගන්තිය | දෙවන වගන්තිය | |
|---|---|---|---|
| 36. | ප්‍රංශ විප්ලවයට හේතුව ආදී තන්ත්‍රයේ දුර්වලතාය. | නැපොලියන් බලයට පත් කිරීමේ අරමුණෙන් ජනතාව කැරලි ඇති කළහ. | (......) |
| 37. | මෙටර්නික් විප්ලවවාදී මූලධර්ම ආරක්ෂා කිරීමට දැඩිව වෙහෙසුනු ප්‍රගතිශීලී පාලකයෙකි. | 19 වන සියවස අග භාගයේ බිස්මාර්ක් ප්‍රංශය තනිකිරීමට රුසියාව හා ඔස්ට්‍රියාව සමඟ මිතුරු විය. | (......) |
| 38. | රුසියාව තුර්කි අධිරාජයාව ආරක්ෂා කරමින් නැගෙනහිර යුරෝපා ප්‍රශ්නයේදී කටයුතු කළේය. | එංගලන්තය බෝල්කන් ප්‍රදේශයට ව්‍යාප්ත කිරීමෙන් තුර්කිය බිඳදැමීමට කටයුතු කළේය. | (......) |
| 39. | I වන ලෝක යුද්ධයේදී ජර්මනිය හා ප්‍රංශය එක් පිළක සිටියහ. | II ලෝක යුද්ධය ආරම්භවූයේ ඇමරිකාව ජපානයට බෝම්බ දැමීමෙනි. | (......) |
| 40. | ප්‍රංශය 17 වන සියවසේ දී යුරෝපයේ බලවතා විය. | I එලිසබෙත් රැජිණ 'ඉන්ටෙන්ඩාන්ට්' යනුවෙන් නිලධාරීන් පත් කළාය. | (......) |

(1 x 40 = 40)

e-thaksalawa The national e-learning portal for The General Education

සියලුම හිමිකම් ඇවිරිණි.
All Rights Reserved


# අධ්‍යයන පොදු සහතික පත්‍ර (උ/පෙළ) විභාගය

# යුරෝපා ඉතිහාසය - II

**13 ශ්‍රේණිය** **කාලය පැය 03 යි.**

- **පළමුවන ප්‍රශ්නයටත්, තවත් ප්‍රශ්න 3 කටත් පිළිතුරු සපයන්න.**

---

01. සපයා ඇති සිතියමේ පහත සඳහන් සියලුම ස්ථාන ලකුණු කොට නම් කරන්න. ඒවායින් කැමති දෙකක් පිළිබඳව කෙටි සටහන් ලියන්න.

(1) ජිබ්‍රෝල්ටා
(2) ඔස්ට්‍රියාව
(3) ලන්ඩන්
(4) ග්‍රීසිය
(5) රයින් ගඟ
(6) වෙස්ට්ෆේලියා
(7) ඩැන්සිග්
(8) චෙකොස්ලෝවැකියාව

02. ප්‍රංශ විප්ලවය ඇති වූයේ ආදී තන්ත්‍රයේ පැවති දුර්වලතා හේතු කොටගෙනය. මෙම ප්‍රකාශය සාකච්ඡා කරන්න. (ල. 14)

03. I ඉතාලිය එක්සේසත් කිරීමට තිබූ බාධක කවරේද? (ල. 7)

II එම බාධක ජය ගැනීමට සමත් වූ ඉතාලිය එක්සේසත් කළ ආකාරය පරීක්ෂා කරන්න. (ල. 7)

04. I යුරෝපීයයන් දේශගවේෂණයට යොමු කළ සාධක කවරේද? (ල. 7)

II දේශගවේෂණය සම්බන්ධයෙන් පෘතුගාලයේ දායකත්වය ප්‍රමාණ කරන්න. (ල. 7)

05. ප්‍රංශය ජාතික රාජ්‍යයක් ලෙස වර්ධනය වූ ප්‍රධාන අවස්ථා පරීක්ෂා කරන්න. (ල. 14)

06. I යුරෝපයේ ආගමික ප්‍රතිසංස්කරණ ව්‍යාපාරය ඇති වීමට තුඩු දුන් හේතු සාධක කවරේද? (ල. 7)

II ආගමික ප්‍රතිසංස්කරණ ව්‍යාපාරයෙන් උද්ගත වූ ප්‍රධාන ප්‍රතිඵල පරීක්ෂා කරන්න. (ල. 7)

07. II වන ලෝක යුද්ධය ඇතිවීමට තුඩු දුන් සාධක සාකච්ඡා කරන්න. (ල. 14)

08. වියානා සම්මේලනයේ ප්‍රධාන කාර්ය සංසිද්ධීන් සාකච්ඡා කරන්න. (ල. 14)

The National e-learning Portal for The General Education

# යුරෝපා සිතියම

